ජාඇල ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාඇල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ජාඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 2 වන පරිච්ඡේදයේ 2.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපර්ච්ඡේදයට අදාලව ලැබී තිබුණු මුද්දර ගාස්තු රු.166,191,135 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් සේ සලකා ගිණුම් ගත කර තිබුණි.	ඉදිරියේදී ගිණුම් ඉදිරිපත් කිරීමේදී මෙම මුද්දර ආදායම මුදල් පදනමින් ගිණුම් තබා හෙළිදරව් කරන බව .	ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ගිණුම් තැබිය යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.2 ඡේදය ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අතිරික්තයට ගලපා තිබුණු රු.177,961,821 ක ශේෂය තුල රු. 1,680,661 ක හඳුනාගත නොහැකි ශේෂයක් තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව .	ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ 6.13 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතය සඳහා ලබාගත හැකි අවස්ථාවේ සිට එය ක්ෂය කිරීම ආරම්භ වීම සිදු කළ යුතු වුවත් සභාවේ ක්ෂය ප්‍රතිපත්තිය ලෙස වත්කමක් මිලදී ගත් වර්ෂයේ ක්ෂය කිරීම සිදුනොකර ඉවත්කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය ගණනය කරන බවත්, තනනලද වත්කම්වල භාවිතය ආරම්භ කරන ලද වර්ෂයට පසු වර්ෂයේ සිට ක්ෂය කරන බවත් දක්වා තිබුණි.	පළාත් පාලන දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරන ලද අංක LGD/09/2019 (1) හා 2020.08.27 දින චක්‍රල්ඛයේ ගිණුම් ප්‍රතිපත්ති හඳුන්වා දීම යටතේ V වැනි ඡේදය අනුව ක්ෂය කළ බව.	ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කඳාන උප කාර්යාලයේ වහලය අළුත්වැඩියා කිරීමට වැයකර තිබූ රු.3,520,122 ක මුදල අළුත්වැඩියා හා නඩත්තු යටතේ ගිණුම්ගත කරනු වෙනුවට ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.	වෙනස සම්බන්ධයෙන් පරීක්ෂා කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ප්‍රාග්ධන ප්‍රදානවල ආරම්භක ශේෂය තුල ඇතුලත් මාර්ග, පාලම්, බෝක්කු වටිනාකම රු.5,601,150 ක් හා බඳුන් වටිනාකම රු.545,000 ක් වූ වත්කම්වලට අදාල ක්‍රමක්ෂය වටිනාකම වන රු. 669,115 ක් විස්තීර්ණ ආදායම ලෙස ගිණුම් ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂවලදී නිවැරදිව සකස් කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් ශේෂ 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.2,736,292 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	වෙනස සම්බන්ධයෙන් පරීක්ෂා කරන බව.	උපලේඛන යාවත්කාලීනව පවත්වා ඒ මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතු වටිනාකම රු. 1,085,099 ක් වූ ගිණුම් විෂයයන් 4 ක් සම්බන්ධයෙන් උපලේඛන සහ කාලවිශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක පරිදි පරික්ෂා කිරීමට නොහැකි විය.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අදාල උපලේඛන/ කාල විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතුය.

1.7. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති			
(i)	අංක 344	ටෙන්ඩර් කමිටුවල සහ ඇගයීම් කමිටුවල සියලු සාමාජිකයින් අපක්ෂපාති බව, අවංකභාවය, පෞද්ගලික සම්බන්ධතාවක් නොමැති බවට එම කමිටුවල පළමු රැස්වීමේදී ප්‍රකාශයක් අත්සන් කළ යුතු වුවත් රාගම රථගාල බදුදීමේ දී එලෙස කටයුතු කර නොතිබුණි.	නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	රීති අනුව කටයුතු කළ යුතුය.
(ii)	අංක 349	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමැතිය ලබා ගත යුතු වුවත්, සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව.	රීති අනුව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1)	වර්ෂ 02 ක් ඉක්මවා ඇති රු.3.307,890 වූ ඉකුත් තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී තැන්පත් නියාදනය සිදුකරන බව.	මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු. 260,402,469 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.108,925,589 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ මුලු ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	2023 ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ මුලු ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.000'	රු.000'	රු.000'	රු.000'	රු.000'	රු.000'	රු.000'	රු.000'
වරිපනම් හා බදු	227,887	233,099	185,868	78,284	56,892	67,148	81,695	31,024
කුලී	23,101	30,350	17,804	51,217	23,174	22,944	20,468	38,671
බලපත්‍ර ගාස්තු	1,917	2,123	2,123	-	1,067	1,748	1,748	-
වෙනත් ආදායම්	1,705	1,578	711	918	780	200	163	50
එකතුව	**254,610**	**267,150**	**206,476**	**130,419**	**81,913**	**92,040**	**104,074**	**69,745**

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ ආදායම තුල රු.130,419,166 ක වර්ෂ 1 ත් 3 ත් අතර රු. 37,240,709 ක් ද වර්ෂ 3 ත් 5 ත් අතර රු. 32,321,331 ක් ද වර්ෂ 5 ට වැඩි රු. 20,575,497 ක් ද පැවතුණි.	හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**වරිපනම් හා බදු**		
	2024 දෙසැම්බර් 31 දිනට වරිපනම් හා බදු රු.78,284,399 ක් හිඟව පැවතුණු අතර ඒ තුළ වර්ෂ 1ත් 3 ත් අතර රු.29,515,847 ක් ද, වර්ෂ 3 ත් 5 ත් අතර රු.2,124,612 ක් ද වර්ෂ 5 ට වැඩි රු.15,596,851 ක් ද විය.	හිඟ මුදල් අයකර ගැනීමට ජංගම සේවා පවත්වා ගෙයින් ගෙට ගොස් අයකිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමින් සිටින බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**වෙනත් ආදායම්**		
	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් වසර ගණනාවක සිට ලැබිය යුතු උසාවි දඩ උපලේඛන සකස් කර ආදායමට හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණු හෙයින් ලැබිය යුතු උසාවි දඩ වශයෙන් කිසිදු ශේෂයක් ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි.	පිළිතුරු ලබා දී නැත.	උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සැලසුම් කමිටු සඳහා සහභාගි වන නිලධාරීන් සැලසුම් කමිටු පැමිණීමේ ලේඛනයෙහි පැමිණීම හා පිටවීම අත්සන් කරනු ලබන නමුත් වේලා සටහන් යන්ත්‍රය අනුව කමිටු රැස්වීම් පැවැත්වූ දිනවල කමිටුවට සහභාගී වන නිලධාරීන්ගේ පිටවූ වේලාවන් සැලසුම් කමිටු පැමිණීමේ ලේඛනයට අනුව පිටවූ වේලාවන් එකිනෙකට වෙනස් වූ අවස්ථා 22 ක් නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	සැලසුම් කමිටුව අවසන් වී පිටව යාමේදී සැලසුම් කමිටුවට සහභාගී වූවන්ට පැමිණීම හා පිටවීම සලකුණු කිරීමට ඇති පැමිණීමෙහි ලේඛණයෙහි අත්සන් කර පිටව යන බව.	සභාවේ නිලධාරීන් ගේ පැමිණීම හා පිටවීම වේලා සටහන් යන්ත්‍රයෙන් තහවුරු විය යුතුය.
(ආ)	සැලසුම් කමිටු රැස්වීමේ පැමිණීම හා පිටවීමේ ලේඛනයට අනුව පිටවීම සටහන් කර තිබුණද, වේලා සටහන් යන්ත්‍රයට අනුව පිටවීම සටහන් කර නොතිබූ අවස්ථාවල හා නිවාඩු ලබා තිබූ අවස්ථාවල කමිටු දීමනා ලෙස රු.52,500 ක් ගෙවා තිබුණි.	වේලා සටහන් යන්ත්‍රයේ පිටවීම සටහන් කිරීම සිදු නොකරන බව.	සැලසුම් කමිටු පැවැත්වීම, පැමිණීම, පිටවීම හා දීමනා ගෙවීම් වල නිවැරදිතාවය තහවුරු විය යුතු ය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට විවිධ ණයහිමියෝ රු. 222,008,150 ක ශේෂයක් පැවති අතර, අවුරුදු 01 ත් 03 ත් අතර රු.68,327,295 ක්ද, අවුරුදු 03 ට වැඩි රු.1,438,387 ක්ද විය. මෙම ශේෂයෙන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	ණයහිමි ශේෂයන්ගේ පැවැත්ම හඳුනාගෙන නිරවුල් කළ යුතුය.
(ඈ)	කැබ් රථයක වාර්ෂික බලපත්‍ර ලබාගැනීම 2017 නොවැම්බර් 28 දිනෙන් පසුව යාවත්කාලීන කර නොතිබුණි. 2021 සැප්තැම්බර් 28 දිනෙන් පසුව වාහනය සර්විස් කිරීම යාවත්කාලීන කර නොතිබුණි.	දැනට මේ සඳහා සාධාරණීකරණ වාර්තා සකස් කර රක්ෂණ බලපත්‍ර ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව.	වාහනය සේවා කර වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ඔක්තෝබර් 23 දින රාගම තේවත්ත පාරේ කර්මාන්ත බදු, වෙළඳ ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර සමීක්ෂණ වාර්තාවට ව්‍යාපාර 9 ක් ඇතුළත් වී නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි තත්වයන් පිළිබඳව සැලකිලිමත්ව අදාල ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව.	සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදු කළ යුතුය.

(ආ)	සභාව විසින් බදු දීමට යෙදෙනු රාගම රථගාලෙහි අදාළ භූමි ප්‍රමාණය, පිහිටීම, ගාල් කළ හැකි වාහන ප්‍රමාණය ආදි විස්තර කිසිවක් ගිවිසුම තුල අඩංගු කර නොතිබුණි. ඒ අනුව රථ ගාල ලෙස භාවිතයට ගන්නා භූමි ප්‍රමාණය භෞතික පරික්ෂාවේදි නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි විය.	රථගාල වටා GI පයිප්ප සවිකර දැල් ආවරණය කර මායිම් සලකුණු කිරීම සිදුකර ඇති බව.	ගිවිසුමේ භූමි ප්‍රමාණය දැක්විය යුතුය.
(ඇ)	සභාව විසින් බදු දී තිබුණු රාගම රථගාල භූමිය තුල බාහිර පුද්ලගයෙකු විසින් තාවකාලිකව ඉදිකර පවත්වාගෙන යනු ලබන ප්ලාස්ටික් වෙළඳසැල සඳහා සභාව විසින් මාසික ගාස්තුවක් අය කරන බවත් එලෙස වෙළඳසැලක් පවත්වාගෙන යාම වෙනුවෙන් විධිමත් පරිදි ගිවිසුමකට එළඹ නොතිබුණි. මෙම තාවකාලික ප්ලාස්ටික් බඩු කඩය හේතුවෙන් රථගාල හිමිකරුට වූ අලාභය හේතුවෙන් 2024 පෙබරවාරි සිට මැයි දක්වා ගෙවිය යුතු මාසික වාරික මුදල් පොලී රහිතව වාරික 10 කින් ගෙවීමට අවසර ලබා දී තිබූ අතර ඒ අනුව සභවේ නිළධාරින් විසින් ගනු ලැබූ තීරණ මත රථගාල් භූමි ප්‍රමාණය අඩුවී එයින් ලැබෙන ආදායම් ද අහිමිවීමක් සිදු වී තිබුණි.	ඉදිරියේදී පත්වන සභාවට වාර්තාවක් යොමුකර තීරණයක් ගැනීමට නියමිත බව.	තාවකාලික කඩ කාමරය ඉවත් කිරීමට හෝ විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	වාර්ෂිකව බදු දුන් සභාව සතු දේපලවලින් දේපල 05 ක මාසික බදු කුලී රු.7,057,104 ක හිඟයක් පැවති අතර, දිගින් දිගටම ගෙවීම් පැහැර හැරීමේ දී සභාව විසින් ගිවිසුම් අනුව කටයුතු කර නොතිබුණි.	ඇප මුදල් තබා ඇති දේපලවල මුදල් නියමිත පරිදි ආදායමට ගැනීමට කටයුතු කරන බව හා නීතිමය කටයුතු කළ යුතු දේපල ඒ සඳහා යොමු කරන බව.	හිඟ බදු මුදල් අයකර ගැනීමත් ගිවිසුම අනුව කටයුතු කිරීමත් කළ යුතුය.
(ඉ)	රාගම අංක 01 එළු කුකුළු මස් වෙළඳසැල සඳහා ගිවිසුම්ගත වීමකින් තොරව 2024 වර්ෂයේ දේපල භාවිතා කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. 2024 ඔක්තෝම්බර් 15 දිනට රු.915,959 ක බදුකුලී හිඟව පැවතිය ද බදුකුලිය ලෙස මාසිකව කිසිදු වාරිකයක් බදුකරු ගෙවා නොතිබුණි. එසේ වුවද ගිවිසුමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් නීතිමය පියවර ගැනීමට ද සභාව අපොහොසත් වී තිබුණි.	බදුකරු සොයාගැනීමට නොහැකි වීමෙන් මෙම තත්ත්වය උදා වී ඇති බව.	ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය.

(ඊ)	බටුවත්ත උපකාර්යාලයෙහි කඩ කාමර 10 ක් දිගු කාලීන පදනම මත බදු ලබා දී තිබූ අතර එම කඩ කාමර බදු ලබා දීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදි පහත කරුණු අනාවරණය විය.		
(i)	බදු ගැනුම්කරුවන් සමග එළඹි ගිවිසුමෙහි 09 කොන්දේසිය අනුව බදු ගැනුම්කරු බදු දීමනාකරුගේ පූර්ව ලිඛිත එකඟතාවය ලබා ගැනීමකින් තොරව අතුරු බදු ලබා දී තිබුණද, ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	කඩහිමියන් විසින් ගෙවියයුතු බදු මුදල්ද හිගයකින් තොරව ගෙවා ඇති බව.	ගිවිසුම් අනුව කටයුතු කළ යුතුය.
(ii)	ගිවිසුම්කාලය 2022 වර්ෂයේ දී අවසන් වී තිබුණත් ගිවිසුමේ කොන්දේසි අංක 30 අනුව කටයුතු කර ගිවිසුම් අහෝසි කිරීමට හෝ නැවත ගිවිසුම්ගත වීමට කටයුතු නොකර කඩ කාමර 09 ක් ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමට අවසර ලබා දී තිබුණි.	ඉතා කඩිනමින් ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව.	ගිවිසුම් අහෝසි කිරීමට හෝ නැවත ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය.
(iii)	ගිවිසුමෙහි කොන්දේසි අංක 06 අනුව බදු ගැනුම්කරු විසින් ගිවිසුම ආරම්භ වන දිනෙන් ආරක්ෂක ඇප තැන්පත් මුදල වශයෙන් මාස 12ක කාල සීමාවට අදාල කුලී මුදලට සමාන මුදලක් බදු දීමනාකරු වෙත ගෙවිය යුතු වුවත් කඩ කාමර 10 ට අදාලව එලෙස කටයුතු කර නොතිබුණි.	මේ වන විට ගිවිසුම් අත්සන් කරමින් ආරක්ෂිත ඇප මුදල ලබාගැනීම ද සිදුකිරීම ආරම්භ කර ඇති බව.	ගිවිසුම අනුව කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 පෙබරවාරි 8 දිනැතිව සභා සම්මත වූ ප්‍රත්‍යාගණන කමිටු වාර්තාව මඟින් 2021 ඔක්තෝම්බර් 12 දිනැතිව සම්මත වූ දේපල 13 කට අදාල ප්‍රත්‍යාගණන කමිටු වාර්තාවේ සඳහන් තක්සේරු කල වටිනාකම් හා නිවැරදි කළ යුතු දේපල ප්‍රමාණයේ වෙනස්කම් නිවැරදි කළ යුතු බව දක්වා තිබුණ ද එම වෙනස්කම් හඳුනාගෙන නොතිබූ හෙයින් දේපල 13 කට අදාලව කමිටු වාර්තාව අනුව වටිනාකම හා ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් වටිනාකම අතර රු.386,235,250 ක වෙනසක් නිරීක්ෂණය විය.	ස්ථාවර වත්කම් වල වටිනාකමෙහි පවතින වෙනස නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව	ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.

(ආ)	නියැදි විගණන පරීක්ෂාවට අනුව දේපල 15 ක වටිනාකම නිවැරදිව තක්සේරු කර ලේඛනගත කර නොතිබුණි.	මෙම දේපල 15 හි ඉඩම්වල වටිනාකම මසක් ඇතුලත තක්සේරු කර නිවැරදි කර විගණනයට ඉදිරිපත් කරන බව.	ඉඩම්වල නිවැරදි වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කළ යුතුය.
(ඇ)	2023 ජුලි 10 දින වත්කම් කළමණාකරණ හා ප්‍රත්‍යාගණන කමිටු වාර්තාව අනුව මුළු දේපල 176 කින් ඔප්පු සකස් කළ යුතු පිඹුරු ඇති දේපල 18 ක් පිඹුරු සකස් කළ යුතු ඔප්පු ඇති දේපල 20 ක් ද ඔප්පු හා පිඹුරු සකස් කළ යුතු දේපල 76 ක් ද ගැටළු සහිත දේපල 19 ක් ද හඳුනාගෙන තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීම් සිදුකර කර නොතිබුණි.	පිඹුරුපත් ලද වහාම ඔප්පු ලිවීමට කටයුතු කරන බව.	දේපලවල ඔප්පු හා පිඹුරු සකස් කර දේපලවල අයිතිය හා ආරක්ෂාව තහවුරු කළ යුතුය.
(ඈ)	2024 දෙසැම්බර් 31 දිනට ජා ඇල ප්‍රාදේශීය සභාව භාවිතා කරන වාහන හා යන්ත්‍ර 61 කින් වාහන හා යන්ත්‍ර 10 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර TON 8 මාර්ගතලනය 2018 වර්ෂයේ සිට භාවිතාකිරීමකින් තොරව පැවතිණි.	විගණනයෙන් පෙන්වා ඇති වාහන සභාවට පවරා ගැනීම සඳහා කොම්ට්‍රෝලර් ජනරාල් වෙත යොමුකර අදාල පවරා ගැනීම් සිදුකිරීමට කටයුතු කරන බව.	වාහන හා යන්ත්‍ර සභාව වෙත පවරා ගෙන වත්කම් උපරිම කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	කඳාන බටහිර ග්‍රාම නිලධාරී වසමේ වටරවුම් පාරේ වමට ඇති කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා දින රහිත ඇස්තමේන්තු 2 ක් සකස්කර තිබුණි.	ප්‍රද්ශවාසීන්ගෙන් සිදුකළ දැඩි ඉල්ලීම මත ඇස්තමේන්තු කළ ව්‍යාපෘතිය නොව වෙනත් ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තු සකස් කර එම ව්‍යාපෘතිය නිම කළ බව.	අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන නිවැරදිව ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 01/2021 දරන මූල්‍ය චක්‍රලේඛය අනුව අනුමත සමිති වෙත කොන්ත්‍රාත් පැවරීමේ ආකෘතිය ප්‍රකාරව ඉහත කොන්ත්‍රාත්තුව සඳහා වැඩ පැවරීම සලකා බැලීම සහ අදාල අයදුම්පත්‍රයෙහි 2.3 යටතේ සමිතිය සතු මාර්ග කොන්ත්‍රාත් පළපුරුද්ද පිළිබඳ සහතික ලෙස වෙනත් පුද්ගලික ආයතනයක් ඉදිරිපත් කර තිබීම ද විගණනයට ගැටලුකාරී විය. අදාල ව්‍යාපෘතිය සත්‍ය ලෙසම සමිතිය මගින් ඉටුකළේ ද උප කොන්ත්‍රාත්තුවක් ලෙස ඉටුකරන ලද්දේද යන්න විගණනයේ දී හඳුනාගත නොහැකි විය.	සමිතිය විසින් උප කොන්ත්‍රාත් ලබාදීමක් සිදුකර නොමැති බව.	චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්යමණ්ඩලයේ 20 දෙනෙකුගේ පුරප්පාඩුවක් පැවතුණි.	ඉදිරියේදී මෙම ගැටළුව විසඳෙණු ඇතැයි විශ්වාස කරන බව.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.
(ආ)	2025 මාර්තු 25 දිනට වාර්ෂික ස්ථාන මාරු යටතට ගැනෙන සභාවේ සේවා කාලය වර්ෂ 05 ක් සම්පූර්ණ කර තිබූ නිලධාරීන් 16 දෙනෙකු සඳහා ස්ථාන මාරු කිරීම් සඳහා කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම නිලධාරීන් සභාවේ සම්පූර්ණ කර තිබූ සේවා කාලය වර්ෂ 05 සිට වර්ෂ 13 ත් අතර කාල සීමාවක වුණි.	ස්ථාන මාරුවීම් නියෝග 12 ක් අතරින් මේවන විට 10 ක් ක්‍රියාත්මක වී ඇති බව.	සම්පූර්ණ කළ නිලධාරීන්ට ස්ථාන මාරුවීම් ලබාදිය යුතුය.